Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- :- ගණිතය

සතිය- 2 (1 වාරය)

ශ්‍රේණිය:- 8

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

(ඉගෙනුම් කාලය :- පැය 2 )

## <u>සංඛ්‍යා රටා</u>

1.3 ඔත්තේ සංඛ්‍යා රටාව

- 2 න් බෙදූ විට 1 ක් ඉතිරි වන සංඛ්‍යා , ඔත්තේ සංඛ්‍යා ලෙස හැඳින්වේ.
  1, 3, 5, 7, ... යන ඔත්තේ සංඛ්‍යා රටාවේ පොදු පදය(සාධාරණ පදය) ලබා ගන්නා ආකාරය බලමු.

| පදය | දෙකෙහි ගුණාකාර | 2හි ගුණාකාරය – 1 | ඔත්තේ සංඛ්‍යාව |
|---|---|---|---|
| පළමු වැනි පදය | $2 = 2 \times 1$ | $(2 \times 1) - 1$ | $2 - 1 = 1$ |
| දෙවැනි පදය | $4 = 2 \times 2$ | $(2 \times 2) - 1$ | $4 - 1 = 3$ |
| තුන් වැනි පදය | $6 = 2 \times 3$ | $(2 \times 3) - 1$ | $6 - 1 = 5$ |
| ⋮ | ⋮ | ⋮ | ⋮ |
| 10 වැනි පදය | $20 = 2 \times 10$ | $(2 \times 10) - 1$ | $20 - 1 = 19$ |
| ⋮ | ⋮ | ⋮ | ⋮ |
| $n$ වැනි පදය | $2n = 2 \times n$ | $(2 \times n) - 1$ | $2n - 1$ |

- 1න් පටන් ගෙන ඔත්තේ සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට පද පිහිටි 1, 3, 5, 7, ...සංඛ්‍යා රටාවේ සාධාරණ පදය 2n-1 වේ.
- 8, 9 පිටු අධ්‍යයනය කර 1.3 අභ්‍යාසය කරන්න.

1.4 සමචතුරස්‍ර සංඛ්‍යා රටාව ත්‍රිකෝණ සංඛ්‍යා රටාව

- 1, 4, 9, 16, ...සංඛ්‍යා රටාව සමචතුරස්‍ර සංඛ්‍යා රටාව වේ. ගණින සංඛ්‍යාවක් එම ගණින සංඛ්‍යාවෙන් ගුණ කළ විට සමචතුරස්‍ර සංඛ්‍යාවක් ලැබේ.මෙම සංඛ්‍යා සමචතුරස්‍රාකාර ලෙස තිත් සටහනකින් නිරූපණය කළ හැකිය.
- 10 පිටුව අධ්‍යයනය කර සමචතුරස්‍ර සංඛ්‍යා රටාවේ සාධාරණ පදය ලබා ගන්නා ආකාරය පියවර සහිතව ලියා දක්වන්න.
- 1, 3, 6, 10, 15, ...සංඛ්‍යා රටාව ත්‍රිකෝණ සංඛ්‍යා රටාව වේ.මෙම සංඛ්‍යා රටාවේ එක් එක් පදය ත්‍රිකෝණාකාර ලෙස තිත් සටහනකින් නිරූපණය කළ හැකිය.පෙළ පොතේ 10.11 පිටු අධ්‍යයනය කර ත්‍රිකෝණ සංඛ්‍යා රටාවේ සාධාරණ පදය ලබා ගන්නා ආකාරය පියවර සහිතව ලියා දක්වන්න.
- 1.4 අභ්‍යාසය කරන්න.